# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපායසස , බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1468 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 14/09/2024<br>පැය 1235 |

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජන මාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. 2024.09.13 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 01 | 01 | 22500 | - | - |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. නීති විරෝධී මත්පෙති සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පස්සර කඳවුර**

2024.09.13 වන දින කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පස්සර කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් බදුල්ල පොලිස් වසමේ වැටලීමක් සිදු කර වෛද්‍ය නිර්දේශ නොමැතිව අන්තරාදායක ඖෂධ මත්පෙති 831 ක් සන්තකයේ තබාගත් සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන බදුල්ල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 58 ක් වූ උඩුවර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** බදුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. බලපත්‍ර නොමැතිව වැලි ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුවරසන්කුලම් කඳවුර**

2024.09.13 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුවරසන්කුලම් කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් පරයානකුලම් පොලිස් වසමේ ආඩියාපුලියන්කුලම් ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව වැලි ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු ටිපර් රථයක් සමඟ අත්අඩංගුවට ගෙන පරයානකුලම් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වූ මඩු ප්‍රදේශයේ පදිංචිකාරුවෙකි.** පරයානකුලම් පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. බලපත්‍ර නොමැතිව වැලි ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ඉල්ප්පුකඩවායි කඳවුර**

2024.09.13 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ඉල්ප්පුකඩවායි කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ජයපුරම් පොලිස් වසමේ ජයපුරම් ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව වැලි ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු ටිපර් රථයක් සමඟ අත්අඩංගුවට ගෙන ජයපුරම් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වූ නීර්වැලි ප්‍රදේශයේ පදිංචිකාරුවෙකි.** පරයානකුලම් පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05. කේරළ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුර**

2024.09.13 වන දින රාත්‍රි කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුරේ නිලධාරින් විසින් රාජාංගනය පොලිස් වසමේ යාය 14 ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර කේරළ ගංජා කිලෝ 203 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන රාජාංගනය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45 ක් වූ යාය 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** රාජාංගනය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**